**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 17 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම්**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,601.22 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,584.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 16.56 ක් හෙවත් සියයට 1.03 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,547.22 | 1,540.57 | 6.65 | 0.43 |
| මූලධන | 54.00 | 44.09 | 9.91 | 18.00 |
| **එකතුව** | **1,601.22** | **1,584.66** | **16.56** | 1.03 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 32 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 7,441 ක් හා රු.මිලියන 1,388 ක් වශයෙන් එකතුව රු.මිලියන 8,829 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,036 ක් හා රු.මිලියන 1,277 ක් වශයෙන් රු.මිලියන 8,313 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 405 ක් හා රු.මිලියන 111 ක් වශයෙන් එකතුව රු.මිලියන 516 ක් හෙවත් සියයට 5.56 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂයය අංක 27201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 85.66 | 69.71 | 78.00 | 91.36 | 300.00 | 252.70 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 974.03 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6003/0000/00/0048/0000/000 | 7.70 |
| 6000/0000/00/0001/0068/000 | 2.33 |
| 6000/0000/00/0013/0060/000 | 119.37 |
| 6000/0000/00/0016/0042/000 | 526.07 |
| 6000/0000/00/0017/0013/000 | 14.63 |
| 6000/0000/00/0018/0054/000 | 3.93 |
| 6000/0000/00/0011/0600/000 | 300.00 |
| **එකතුව** | **974.03** |

## 2.4 විගණන නිරීක්ෂණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

### 3.2 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.29,156,582 ක්වූ තැන්පතු ශේෂ 30 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම් අංක 6000/0000/00/0011/0600/000 යටතේ වසරකට වැඩි කාලයක සිට පැවත එන 2015 දෙසැම්බර් 31 දිනට රු.300,000,000 ක පොදු තැන්පත් ශේෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,305,907 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------------**

**නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් වසරකට ආසන්න කාලයක් අලුත්වැඩියා නොකර ධාවනයෙන් ඉවත් කර තිබුණි. ජල බවුසරය හා රෝද දෙකේ කුබෝටා ට්‍රැක්ටරය භාවිතයෙන් ඉවත් කිරීම හේතුවෙන් වසර ගණනාවක් කාර්යාල පරිශ්‍රයේ දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිරිපිටිය නගරයට ආසන්නව පර්චස් 80 ක රජයේ ඉඩම හා එහි පවත්වාගෙන ගිය තානායම දැනට වසර 10 කට අධික කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගරා වැටෙමින් පැවතුණි.

(ඇ) කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාවිතයට නොගන්නා වාහන 06 ක් වසර ගණනාවක සිට කාර්යාල භූමියේ දිරාපත්වෙමින් පැවතුණි.

(ඈ ) කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයේ වැසිය දිරාපත්වීම මත ධාවනයෙන් ඉවත්කර මාස 06 ක පමණ කාලයක් කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**---------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| තුවක්කු ආඥා පනතේ 5(1), 23(3) හා 22(2) (උ) වගන්තිය සහ 2015 සැප්තැම්බර් 30 දිනැති ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක.MOD/ CIS/ 3/F/2/2016/01 දරන ලිපිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක ගිනි අවි හිමියන් 64 ක ප්‍රමාණයක් වසර ගණනාවක සිට ගිනි අවි බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 03 ක සහ මල්ලවපිටිය, ගනේවත්ත, බිංගිරිය, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව මාස 06 කට වරක් සිදුකර නොතිබුණි. |

**(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

| | |
|---|---|
| 2011 ජූනි 14 දිනැති කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ නියෝග අං.ක.1/2011 | ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කළ යුතු සෑම නිලධාරියෙකුම ඊට පෙර මාසයේ 25 දින වන විට ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කළ යුතු නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ පොල්පිතිගම, කුලියාපිටිය (නැගෙනහිර), උඩුබද්දාව, අලව්ව, වාරියපොල, නාරම්මල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇතැම් ක්ෂේත්‍ර නිලධාරීන් එසේ කටයුතු කර නොතිබුණි. |

## 3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තු කර තිබුණු එකතුව රු.15,149,682 ක් වටිනා ව්‍යාපෘති 22 ක් අධික වර්ෂාව නිසා ආරම්භ නොකර අත්හැර තිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම කිරීමෙන් පසු ප්‍රතිලාභ**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හැවැන්පැලැස්ස ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ "එක ගමකට එක වැඩක්" වැඩසටහන යටතේ රු.490,000 ක වියදම් කර තිබුණද, ක්‍රීඩා පිටියේ එක් කෙලවරක් විශාල ලෙස බැවුම් සහිතව පැවතීමෙන් එය භාවිතා කරන්නන්ට අවධානමක් වී පැවතුණි.

(ii). වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාරියපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය මින් පෙර අවස්ථාවකද විවෘත කර අසාර්ථකත්වයට පත්ව තිබියදී නැවත වරක් ශක්‍යතා

අධ්‍යයනයකින් තොරව 2015 ජූනි මාසයේදී විවෘත කර ඒ සඳහා රු.741,565 ක් වැය කර තිබුණි. 2015 දෙසැම්බර් මාසය වන විට මෙම ස්ථානය නැවත භාවිතයකින් තොරව වසා දමා තිබුණි.

(iii). මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හේවාපොල ගම මැද පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.459,005 ක් වැයකර තිබුණද, මාර්ගයේ මැද අඩි 20 ක පමණ දුරක කොටසක් කැඩී තිබුණි.

(iv). මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බහු කාර්ය ගොඩනැගිල්ල සඳහා රු.1,152,738 ක් වැය කර තිබුණු අතර, ඉදිරිපස වේදිකාව අසල බිත්තියේ දෙපස පුපුරායාම, වේදිකාව අසල බිම සිමෙන්ති පුපුරා තිබීම හා වහලයේ ඇතැම් ස්ථාන කැඩී තිබුණි.

(v). පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලගෙදර ග්‍රාම නිලධාරී වසමේ කෝන්කුඹුරට යන මාර්ගය බෝක්කුවක් දැමීමට රු.381,957 ක් දිමුනුව ග්‍රාමීය සමෘද්ධි සමිතියට ගෙවා තිබුණද, යොදා තිබූ බෝක්කු ප්‍රමාණවත් නොවීම නිසා බෝක්කුවට පහළින් පාර උඩින් ජලය ගලා යාමෙන් පාර කැඩී තිබුණි.

(vi). උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ පළුගමුව මැදිරිය වැවේ ඇලවේලි කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,974,000 ක් වැයකර තිබුණද, වැවෙහි ජලය අවශ්‍ය ස්ථාන වෙත ගෙනයාමේ කාර්යය සම්පූර්ණ වී නොතිබුණි.

(vii). උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 දැයට කිරුළ ජාතික වැඩසටහන යටතේ දුම්මලසූරිය වීහේන මාර්ගයේ වේල්ල කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,472,107 ක් වැයකර තිබුණද, විගණන අවස්ථාව වන විට ඇලවේලි ජලයෙන් යටවී තිබුණි.

(viii). පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වලකුඹුරුමුල්ල පානීය ජල ව්‍යාපෘතිය යටතේ රු.1,096,399 ක් වැයකර ළිඳක් ඉදිකර තිබුණද, ජල පොම්පාගාර, ජල ටැංකි, ජලනල පද්ධති හා ජල පොම්පය ඉදි කර නොතිබුණි.

## 3.7 පාඩු හා හානි

-----------------

විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට අනුව තවදුරටත් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරීමට තිබුණු එකතුව රු.3,856,240 ක පාඩු අතර රු.131,011 ක වසර 05 කට වැඩි කාලයක සිට පැවැත එන ශේෂයක්ද විය.

## 3.8 කළමනාකරණ දුර්වලතා

------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කොබෙයිගනේ, නිකවැරටිය සහ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන් නොකඩවා වැඩිහිටි ජීවනාධාර දීමනා ලබා නොගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරීන් හේතු සොයා බලා නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු අංශය විසින් ක්‍රියාත්මක කරන ලද 2014 වර්ෂයේ දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ මුළු වැඩ වටිනාකම රු.1,497,110,430 ක් වූ ව්‍යාපෘති 76 ක ප්‍රමාණයක් 2016 පෙබරවාරි 29 දින වන විටද අවසන් කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල හා සංචිත වාහන 10 ක් සඳහා රියදුරන් 08 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2014/2015 මහ කන්නය වගා කිරීමෙන් පසු අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන්ගේ ඉල්ලීමකින් තොරව හා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව බිත්තර වී සහනාධාර වශයෙන් රු.10,330,672 ක් ගොවීන් වෙත මුදලින් ලබා දී තිබුණි. බිත්තර වී සහනාධාරය ලබා ගත් ගොවීන් විසින් වී ගොවිතැන් කළ බවට පසුවිපරම් කිරීමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කර නොතිබුණි. එසේ රු.123,690 ක බිත්තර වී සනාධාරය ලබාගත් ගොවීන් 78 දෙනෙකු විසින් පොහොර සහනාධාර ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ගෙවා තිබුණු බිත්තර වී සහනාධාරය වී ගොවිතැන් කිරීම සඳහා යොදා ගත් බවට තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් වී නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 128 | 119 | 10 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 76 | 57 | 20 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 3,784 | 3,500 | 314 | 30 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 312 | 276 | 37 | 01 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| | **එකතුව** | **4,300** | **3,956** | **381** | **37** |

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2011 ඔක්තෝබර් 25 දිනැති අංක.12/2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව සහ 2011 සැප්තැම්බර් 08 දිනැති අංක.16/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ මූලධර්ම අනුගමනය කරමින් අනෙකුත් සියලුම රාජ්‍ය සේවාවන් සඳහා ස්ථාන මාරු ක්‍රමවේදයක් ස්ථාපිත කළයුතු නමුත්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි වර්ෂ 05 කට වැඩි කාලයක් එක් සේවා ස්ථානයකට සේවයේ යෙදී සිටින නිලධාරීන් විශාල සංඛ්‍යාවක් විය.